සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 15 S I

නම: ..............................................

# ක්‍රිස්තියානි ධර්මය

කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01) දේව මැවිල්ලේ පාලනය මිනිසාට භාර කරන ලද්දේ,
1. ක්‍රිස්තුස්වහන්සේ ය
2. දෙවියන්වහන්සේ ය
3. ශුද්ධාත්මයාණන්වහන්සේ ය
4. සාතන් ය

02) අප තුළ වර්ධනය කරගත යුතු ශුද්ධාත්ම ඵලයක් වන්නේ,
1. ප්‍රීතියයි
2. නපුරුකමයි
3. ඊර්ෂ්‍යාවයි
4. උඩගුකමයි

03) "මා පවිත්‍ර කරන්න ඔබට පුළුවන" මෙසේ ප්‍රකාශ කළේ,
1. මී මැස්මොර රෝගියා ය
2. ලාදුරු රෝගියාය
3. කුදු ස්ත්‍රියයි
4. ලාදුරු රෝගීන් දසදෙනාය

04) ශ්‍රී ලාංකික ජන ජීවිතය ගොඩනැංවීමට දායක වූ පුද්ගලයකු වන්නේ,
1. මයිකල් රොද්‍රිගු පියතුමා
2. II ජුවාම් පාවුල් පාප්වහන්සේය
3. මැල්කම් රංජිත් කාදිනල්තුමාය
4. හැරල්ඩ් ඇන්තනි රදගුරුතුමාය

05) 'මව් කුසයෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නටත් පෙර මම නුඹ හඳුනා ගතිමි" මෙසේ ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
1. ඒසකියෙල්ය
2. ජෙරමියාය
3. ආමොස්ය
4. යෙසයාය

06) විප්‍රවාසයෙන් පසුව ඊශ්‍රායෙල් ජනතාවට නායකත්වය ලබා දුන් පුද්ගලයා වන්නේ,
1. ආබ්‍රහම්ය
2. ඊසාක්ය
3. එස්රාය
4. ජාකොබ්ය

07) ජේසුස් වහන්සේගේ පාමුල සිට වචනය ඇසූ කාන්තාව වන්නේ,
1. මීරියම්ය
2. ජෝවන්නාය
3. මාර්තාය
4. මරියාය

08) "ජේසුස්ගේ ප්‍රේමේ විශාල පුදුමය වේ." ගීතය නිර්මාණය කළේ,
1. ජොයිස් ද සිල්වා ය
2. ඉව්ලින් කානි ය
3. එලීසා ඇග්නිම් ය
4. තෙරේසා මව්තුමිය ය

09) අප මැවිල්ල තුළ ඇති සම්පත්,
1. විනාශ කළ යුතුය
2. අරපිරිමැස්මෙන් භාවිත කළ යුතුය
3. පොදුවේ පරිහරණය කළ යුතුය
4. පෞද්ගලිකව පමණක් භාවිත කළ යුතුය

10) "ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් උන්වහන්සේ ලෝකයට ප්‍රේම කළ සේක" මෙසේ සඳහන් වන්නේ,
1. නික්මයාම
2. ශු. ලූක්ය
3. ශු. ජොහන්ය
4. I යොහන්ය

11) දේව පුත්‍රයාණන් ප්‍රතික්ෂේප කරන අයට වන විපාක උන්වහන්සේ පැහැදිලි කළේ,
1. සමරිතානුවරයාගේ කථාව තුළිනි
2. වපුරන්නාගේ උපමාව තුළිනි
3. මුහුන් පිළිබඳ උපමාව තුළිනි
4. සොදොම් - ගොමෝරා සිදුවීම තුළිනි

12) 'යාච්ඤාවේ ගුරුවරිය' ලෙස විරුදාවලිය ලැබුවේ,
1. එලීෂා ඇග්නිව් ය
2. ජොයිස් ද සිල්වා ය
3. මාර්තා සහ මරියා ය
4. ඉව්ලින් කානි ය

13) ජේසුස් වහන්සේ ක්‍රිස්තුවරයාණන් බව ප්‍රකාශ කළේ,
1. තෝමස් ය
2. පේදුරු ය
3. ජුදස් ය
4. ජාකොබ් ය

14) ශු. බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව වන්නේ,
1. 39 කි. 2. 46 කි. 3. 47 කි. 4. 48 කි.

15) කායින් සහ ආබෙල් පිළිබඳ කතා පුවත අඩංගු ග්‍රන්ථය වන්නේ,
1. උත්පත්තිය 2. නික්මයාමය
3. ලෙවී ව්‍යවස්ථාවය 4. ගණන් කථාවය

16) ආබ්‍රහම්ගේ බිරිඳ වන්නේ,
1. රෙබෙකා ය 2. මිරියම් ය 3. සාරා ය 4. එළිසබෙත් ය

17) 'ඊසාක්' යන නමෙහි අර්ථය වන්නේ,
1. ජලයෙන් ගොඩගත් යන්නයි 2. සිනාසීම යන්නයි
3. දෙවියන්ගෙන් ඉල්ලා ගත් යන්නයි 4. ඊශ්‍රායෙල් යන්නයි

18) "ස්වාමීන් වහන්සේ මාගේ එඬේරාණෝය" මෙසේ සඳහන් කෘතිය වන්නේ,
1. ගීතාවලිය ය 2. එසකියෙල් ය 3. ජෙරමියා ය 4. යෙසායා ය

19) ඔබ සතු යහපත් ගුණාංගයක් වන්නේ,
1. බොරු කීමයි 2. ඉවසීමයි 3. අන්අයට චෝදනා කිරීමයි 4. වෛර කිරීමයි

20) 'ක්‍රිස්තව සේවා ආශ්‍රම්' නිර්මාණය කළේ,
1. ඉව්ලින් කානි ය 2. ජොයිස් ද සිල්වා ය
3. ඩොනල් කනගරත්නම් ය 4. සේවක සැමුවෙල් සෙල්වරත්නම් ය

## II කොටස

**• පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01)කෙටි පිළිතුරු ලියන්න.

i. මැවීමේ කථාව තුළ සර්පයාගෙන් සංකේතවත් වන්නේ කුමක් ද?
ii. ජෙරමියා දිවැසිවරයා හට දක්නට සැලැස්වූ දර්ශන 02 ක් ලියන්න.
iii. සමාජ සාධාරණත්වය ගොඩනැගීම සඳහා නෙහෙමියා අනුගමනය කළ ප්‍රතිපත්ති 02 ක් ලියන්න.
iv. ආදි පියවරු දෙදෙනෙක් නම් කරන්න.
v. ජේසුස් වහන්සේට ලෙවී හමු වූ ස්ථානය කුමක් ද?
vi. 'යෞවනය නැගිටින්න' ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ කාට ද?
vii. ඊශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේ මඟපෙන්වූ ආකාර 02 ක් ලියන්න.
viii.ඊශ්‍රායෙල් ජනතාව පාළුකරයේ දී ආහාරයට ගත්තේ මොනවා ද? (ල.2x8=16)

02) i. "රෝගීන්ට මිස නිරෝගීන්ට වෙදාගෙන් කම් නැත" ක්‍රිස්තුන් වහන්සේ ප්‍රකාශ කළේ කුමන අවස්ථාවේ ද?
ii. ප්‍රේරිතයන් ලෙස තෝරා ගත් පුද්ගලයින්ගේ තිබූ ගුණාංග 03 ක් ලියන්න.
iii. දේව සේවය සඳහා ඔබට කැඳවීමක් ලද හොත් ඒ සඳහා ඔබගේ ප්‍රතිචාරය පිළිබඳ වැකි 05 කින් ඉදිරිපත් කරන්න. (2+3+6=11)

03) i. පව්කරුවෙකු ලෙස සිටි සාකෙවුස් වෙනස් වූ බවට සාධක 02 ක් ලියන්න.
ii. ජුදෙව් සමාජයේ පව්කරුවන් ලෙස සැලකූ පුද්ගලයින් 03 ක් ලියන්න.
iii. ඔබ කරන ලද පාපයන් පසුතැවිලි වෙමින් කෙටි යාච්ඤාවක් ලියන්න. (2+3+6=11)

04) i. මරිය හා මාර්තා කථා පුවතෙහි මරියාගේ ඔබ දකින ගුණාංග 02 ක් ලියන්න.
ii. මරියා හා මාර්තාගේ කථා පුවතින් ක්‍රිස්තුන් වහන්සේ කාන්තාවන්ට ගෙන දුන් අභියෝග මොනවා ද?
iii. කාන්තාවන්ට දේව සේවයේදී ඉටු කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (2+3+6=11)

05) i. ශු. බයිබලයේ මුල් පොත් පහ හඳුන්වන නම් 02 ක් ලියන්න.
ii. උත්පත්ති, නික්මයාම හා ලෙවී ව්‍යවස්ථාවේ අඩංගු වන කරුණු 01 බැගින් ලියන්න.
iii. "සබත් දවස ශුද්ධ ලෙස ගත කරන්න" යන පනත කඩවන අවස්ථා 03 ක් ලියා එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (2+3+6=11)

06) i. ආබ්‍රහම්ට පැමිණි අභියෝග 02 ක් ලියන්න.
ii. දෙවියන් වහන්සේගෙන් ආබ්‍රහම්ට ලැබුණු පොරොන්දු 03 ක් ලියන්න.
iii. ජාකොබ් හා ඒසව් සමගි වීමෙන් අපට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (2+3+6=11)